**නිවිතිගල ප්‍රාදේශීය සභාව**
**රත්නපුර දිස්ත්‍රික්කය**
**--------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 12 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව හා විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2019 මැයි 27 දින සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට නිවිතිගල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය තුල මිලදී ගෙන තිබූ එකතුව රු. 374,000 ක් වූ ස්ථාවර වත්කම් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | අදාල ගැලපීම් කර ගිණුම් නිවැරදි කළ යුතුවේ. | අතපසුවීමකි. 2019 වර්ෂයේ ගිණුම් සැකසීමේදී නිවැරදි කිරීමට සටහන් කර ගතිමි. |
| (ආ) | සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂය තුල ක්‍රියාත්මක කල කර්මාන්ත 14 කට අදාලව ලැබිය යුතු පරිපාලන වියදම් රු. 129,614 ක් ගිණුම්ගත කර නොතිබුණි. | අදාල ගැලපීම් කර ගිණුම් නිවැරදි කළ යුතුවේ. | 2019 වර්ෂයේ ගිණුම් සැකසීමේදී ජර්නල් සටහන් මඟින් ගිණුම්ගත කිරීමට සටහන් කර ගතිමි. |
| (ඇ) | ගිණුම් විෂයයන් 06 කට අදාලව සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන් සහ උපයෝගී ලේඛන අනුව ශේෂයන් අතර රු. 13,090,495 ක වෙනසක් විය. | මූල්‍ය ප්‍රකාශන හා අදාල උපයෝගී ලේඛනවල වටිනාකම සමාන විය යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ඈ) | අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 1,258,163 ක් වූ ගිණුම් විෂයයන් 02 ක් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ සනාථ කලහැකි සාක්ෂි ඉදිරිපත් කල යුතුවේ. | පිළිතුරු ලබා දී නොමැත. |

### 1.4 අනුකූල නොවීම

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571 | 2014 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා කාලයට අදාල රු. 721,368 ක් වූ තැන්පත් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | ඉකුත් තැන්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | 2019 වර්ෂයේදී පොදු තැන්පත් ගිණුමේ ඇති කල් ඉකුත් වූ තැන්පතු සභාවේ ආදායමට ගැනීමට කටයුතු කරමි. එය සභාවට ඉදිරිපත් කර ඇත. |
| (ආ) | 2009 මාර්තු 09 දිනැති හා අංක 2009/01 දරන පළාත් පාලන කොමසාරිස් චක්‍රලේඛයේ අංක 1.10 වගන්තිය | කඩකාමර අතුරු බදුදීම් සම්බන්ධයෙන් සභාව විසින් කටයුතු කර නොතිබුණි. | චක්‍රලේඛ උපදෙස් පරිදි කටයුතු කළ යුතුවේ. | මෙ සම්බන්ධයෙන් කඩකාමර හිමියා 2018 සැප්තැම්බර් 18 දින දැනුවත් කර ඇත. |
| (ඇ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.12.1 (ආ) මාර්ගෝපදේශය | අදාල පිරිවිතර වලට අනුකූල බව තහවුරු කර ගැනීමකින් තොරව රු. 667,000 ක් වටිනා පරිගණක 02 ක්, ලැප්ටොප් 01 ක්, වීථි ලාම්පු 50 ක් හා ජල මීටර් 120 ක් මිලදී ගෙන තිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුකූලව කටයුතු කළ යුතුවේ. | මිලදීගත් සියළුම භාණ්ඩ ඉදිරියේදී ස්වාධීන පරීක්ෂාවක් සිදු කර ගැනීමටත්, මින්පසු මිලදී ගන්නා භාණ්ඩ සියල්ලම ස්වාධීනව පරීක්ෂාවක් සිදුකර ලබා ගැනීමටත් කටයුතු කරමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 9,855,332 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 9,650,864 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | 2018 ඇස්තමේන්තුගත ආදායම | 2018 බිල්කළ ආදායම | 2018 රැස්කළ ආදායම | 2018 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2017 ඇස්තමේන්තුගත ආදායම | 2017 බිල්කළ ආදායම | 2017 රැස්කළ ආදායම - | 2017 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 3,168,296 | 3,279,385 | 3,384,786 | 1,340,102 | 3,122,403 | 3,043,121 | 3,138,589 | 1,402,095 |
| (ii) | කුලී | 4,399,800 | 5,553,416 | 5,568,416 | 90,950 | 4,165,100 | 4,097,000 | 4,053,050 | 105,950 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 538,300 | 479,696 | 483,196 | 1,500 | 406,900 | 380,210 | 376,710 | 5,000 |
| (iv) | වෙනත් ආදායම් | 12,396,250 | 18,427,938 | 17,026,489 | 15,433,247 | 14,435,800 | 14,977,031 | 10,213,649 | 14,157,014 |

**2.2.2 වරිපනම් හා බදු**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසාන දිනට රු. 1,159,990 ක් වූ හිඟ වරිපනම් ශේෂය තුල වර්ෂ 05 ට වැඩි කාලයක සිට පැවත එන ඒකක 206 කට අදාල එකතුව රු. 565,353 ක හිඟයක් ද පැවතුණි. මෙම හිඟ වරිපනම් අයකර ගැනීම සම්බන්ධයෙන් සභාවේ ක්‍රියාකාරීත්වය දුර්වල මට්ටමක විය. | හිඟ ආදායම් රැස්කර ගැනීමට විධිමත් වැඩසටහනක් සැලසුම් කර ක්‍රියාත්මක කළ යුතුවේ. | හිඟ මුදල් අයකර ගැනීම සඳහා හා නොගෙවන දේපල සඳහා ස්ථානීය පරීක්ෂණයක් සිදු කිරීම සඳහා නිලධාරීන් යොමු කර ඇත.<br>තවද හිඟ ආදායම් අය කිරීම සඳහා ඉලක්ක ලබා දී ඇති අතර කාර්තුවකට එක් දිනයක් වශයෙන් දේපල තහනම් කිරීමට යොදා ගෙන ඇත. |
| (ආ) | සමාලෝචිත වර්ෂය අවසාන දින වනවිට රු. 113,578 ක් වූ අයවිය යුතු හිඟ අක්කර බදු ශේෂය තුල වර්ෂ 05 ට වඩා පැරණි රු. 70,821 ක ශේෂ ද ඇතුලත් වී තිබුණු නමුත් හිඟ අක්කර බදු අයකර ගැනීමේ පසු විපරම් කටයුතු දුර්වල මට්ටමක පැවතුණි. | හිඟ ආදායම් රැස්කර ගැනීමට විධිමත් වැඩසටහනක් සැලසුම් කර ක්‍රියාත්මක කළ යුතුවේ. | ලේඛනගත අක්කර බදු ගෙවන ඉඩම් හිමියන් ඉඩම් විකිණීම, කැබලි කිරීම වැනි හේතු නිසා අක්කර බදු ගෙවීම පැහැර හැර ඇත. මෙම වර්ෂයේ ඉදිරි මාස 02 තුළ අක්කර බදු සතොක්ෂණයක් සිදුකිරීමට කටයුතු කරමි. |

**2.2.3 කුලී**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වසර 05 කට වරක් දේපල තක්සේරු කල යුතු වුවද, සභාවට අයත් නිවිතිගල නව වෙළඳ සංකීර්ණයේ කඩකාමර 13 ක් 2004 වර්ෂයෙන් පසු නැවත තක්සේරු කර නොතිබුණි. | වර්ෂ 05 කට වරක් දේපල තක්සේරු කර නව ආදායම් රැස්කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | 2018 සැප්තැම්බර් 07 වන දින මාසික සභා රැස්වීම් සම්මත අංක 05:01:xiv පරිදි නැවත කඩකාමර තක්සේරුවක් සඳහා ලිපි සකස් කොට 2018 ඔක්තෝබර් 18 වන දින තක්සේරු දෙපාර්තමේන්තුව වෙත යොමුකර ඇත. |

**2.2.4 බලපත්‍ර ගාස්තු**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සභා බල ප්‍රදේශය තුල වෙළඳ බලපත්‍ර නිකුත් කල යුතු ආයතන හඳුනාගෙන නොතිබුණු අතර, සමාලෝචිත වර්ෂයේදී ආහාරපාන අලෙවිය හා හෝටල් කර්මාන්තය ඇතුළු ආයතන 166 ක් වෙළඳ බලපත්‍ර ලබා ගැනීම සඳහා ගාස්තු ගෙවා තිබුණද, සෞඛ්‍ය වෛද්‍ය | වෙළඳ බලපත්‍ර ලබා ගතයුතු සියළු ආයතන වෙත විධිමත් පරිදි බලපත්‍ර නිකුත් කිරීමට හැකි වන පරිදි වැඩසටහනක් සැලසුම් | 2019 වර්ෂයේ වෙළඳ බලපත්‍ර නිකුත් කිරීම සඳහා අයදුම්පත් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයට යොමු කලද මේ දක්වා වෛද්‍ය නිර්දේශ ලැබී නොමැති බැවින් වෙළඳ බලපත්‍ර නිකුත් කිරීමට නොහැකි වී ඇත. මේ |

| | | | |
|---|---|---|---|
| | නිලධාරී නිර්දේශ ලබාදීම ප්‍රමාදවීම මත ආයතන 32 ක් සඳහා පමණක් බලපත්‍ර නිකුත් කර තිබුණි. | කර ක්‍රියාත්මක කළ යුතුවේ. | පිළිබඳ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන් සමඟ සාකච්ඡා කර තමාට අදාල වසම් ඇතුලත වෙළඳ ආයතන පරීක්ෂා කිරීමට වැඩසටහනක් මේ වන විට සකස් කර ගෙන ඇත. ඉදිරියේදී මෙය නිවැරදි කර ගත හැක. |
| (ආ) | 1988 අංක 56 සහ 2000 අංක 53 දරන පනත් වලින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පරිසර පනත සහ ඒ යටතේ පනවන ලද රෙගුලාසි ප්‍රකාරව කටයුතු කිරීම සඳහා බලපත්‍ර ලබා නොගත් කර්මාන්ත සභාව විසින් හඳුනාගෙන නොතිබීම නිසා බල ප්‍රදේශයේ පරිසර ආරක්ෂණය සම්බන්ධයෙන් නිසි ක්‍රියාමාර්ග ගැනීමට නොහැකිවී තිබුණි. | බලපත්‍ර ලබා ගතයුතු ආයතන හඳුනාගෙන විධිමත් පරිදි පරිසර බලපත්‍ර නිකුත් කිරීමට කටයුතු කළ යුතුවේ. | දැනට පෙන්වා දී ඇති කර්මාන්ත 05 න් 04 ක් සඳහා පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබා දී ඇත. අනෙක් ආයතනය පිළිබඳ ස්ථානීය පරීක්ෂාවේදී අඩුපාඩු නැවත සකස් කිරීමට උපදෙස් ලබා දී ඇත. |

**2.2.5 වෙනත් ආදායම්**

-------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභා බල ප්‍රදේශය තුල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම් පුවරු සඳහා අයවිය යුතු රු. 96,680 ක් සමාලෝචිත වර්ෂය අවසන් වනවිටද අයකර ගෙන නොතිබුණි. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | සමීක්ෂණයට අනුව අදාල ආයතනයන්ට ගෙවීම් කරන ලෙස දන්වා යවා ඇත. සභාවේ ආදායම් පරීක්ෂක නිලධාරී දෙදෙනෙකු සිටින බැවින් මේ සම්බන්ධයෙන් කඩිනමින් ක්‍රියා කිරීමට උපදෙස් ලබා දී ඇත. |

**2.2.6 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

-----------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2018 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු. 3,376,500 ක් වූ අතර, 2016 වර්ෂයට අදාලව ලැබිය යුතු වූ මුද්දර ගාස්තු රු. 11,843,922 ක් විය. 2017 හා 2018 වර්ෂ වලට අදාලව ලැබිය යුතු මුද්දර ගාස්තු 2019 පෙබරවාරි වනවිටත් හඳුනාගෙන නොතිබුණි. | සභාව වෙත ලැබිය යුතු ආදායම් රැස්කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | 2018 දෙසැම්බර් 31 වන දිනට ලැබිය යුතු උසාවි දඩ මේ වනවිට උපලේඛන සකස් කොට පළාත් සභාවට යොමුකර ඇත. 2017 හා 2018 වර්ෂ වලට අදාල මුද්දර ගාස්තු උපලේඛන සකස් කිරීමට සභාවේ නිලධාරීන්ට අවසර ලබා නොදෙන බැවින් ඒ ඒ වර්ෂ වලට අයත් මුද්දර ගාස්තු හඳුනා ගැනීමට නොහැකි වී ඇත. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

## 3.1 කාර්යසාධනය

-----------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මං,මාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**(අ) ක්‍රියාකාරී සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය වෙනුවෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළ යුතුවේ. | 2018 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර තිබුණත් එය විගණනය වෙත ඉදිරිපත් කර නොමැත. |

**(ආ) තිරසර සංවර්ධන ඉලක්ක**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් සභාව දැනුවත්ව සිටියද එම අරමුණු සඳහා වන ගෝලීය දර්ශක තුළින් සභා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නංවාලීම සඳහා වන දිගුකාලීන සැලසුම් 2018 දෙසැම්බර් වනවිටත් සකස් කර නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු නිවැරදිව හඳුනාගෙන ඊට අදාල දිගුකාලීන සැලසුම් සකස් කළ යුතුවේ. | ඉදිරියේදී සකස් කර විගණනය වෙත ඉදිරිපත් කරමි. |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

-------------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | ප්‍රදේශවාසීන්ට පිරිසිදු පානීය ජලය ලබාදීමේ අරමුණින් සභාව විසින් සකස් කර තිබුණු ජල පෙරණයක් භාවිතා නොකර අදාල සමිතිය විසින් ඍජුවම ජල මූලාශ්‍රයේ ජලය බෙදාහැරීම නිසා සවිකර තිබූ ජල මනුවල රොඩු හිරවී අක්‍රීය වීම හේතුවෙන් ජල පාරිභෝගිකයින් ජල මීටර් ගලවා ඉවත් කර තිබුණි. | ව්‍යාපෘති අරමුණු ඉටු වන බවට පසුවිපරම් කළ යුතුවේ. | ජල පරිභෝගිකයන් සම්බන්ධ කර ගනිමින් මේ සම්බන්ධයෙන් 2018 දෙසැම්බර් 29 දින විශේෂ රැස්වීමක් පැවැත් වූ අතර නැවත ජල පෙරනය භාවිතා කරමින් ජලය පිරිසිදු කර ගැනීමට සමිතිය එකඟතාවය ප්‍රකාශ කරන ලදී. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ජල පාරිභෝගිකයින් විසින් ජල මනු ගලවා තැබීම නිසා ජල මනු සවිකිරීමේ අරමුණ ඉටු කර ගැනීමට නොහැකි වී තිබූ අතර, ජල මනු මිලදී ගැනීම සඳහා වැය කරන ලද රු. 306,100 ක් ද නිශ්ඵල වී තිබුණි. | ව්‍යාපෘති අරමුණු ඉටු වන බවට පසුවිපරම් කළ යුතුවේ. | ජල පාරිභෝගිකයන් විසින් මනු සවි කර ජලය භාවිතා කිරීමට කැමැත්ත ප්‍රකාශ කලද මනු වලින් ලැබෙන ගාස්තු ප්‍රාදේශීය සභාවට ගෙවීමට අකමැත්ත ප්‍රකාශ කරන ලදී. මෙම ගැටළුව ඉදිරියේදී නිරාකරණය කර ගැනීමට කටයුතු කරමි. |

**3.3 අවිධිමත් ගනුදෙනු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| හංගමුව ලබුවත්ත පන්සලමලය පාර කොන්ක්‍රීට් කිරීම සඳහා 2010 වර්ෂයේදී ලැබී තිබුණු පළාත් සභා ප්‍රතිපාදන වලින් වෙනත් මාර්ගයක් සංවර්ධනය කර තිබීම හේතුවෙන් බිල්පත් පියවීම පළාත් සභාව ප්‍රතික්ෂේප කර තිබුණි. කර්මාන්තය සඳහා ලබාදී තිබුණු රු. 200,000 ක අත්තිකාරම සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් පියවා ගැනීමට නොහැකි වී තිබුණි. | නිසි ව්‍යාපෘති අධීක්ෂණයක් සිදුකළ යුතු අතර, පරීක්ෂණයක් පවත්වා වගකිවයුත්තන් හඳුනාගෙන අදාල නිවැරදි කිරීම් කරගත යුතුවේ. | 2010 වර්ෂයේදී පළාත් සභා ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක වූ හංගමුව ලබුවත්ත පන්සලමලය මාර්ගය සඳහා කොන්ත්‍රාත්කරු සමඟ ගිවිසුම් ගතවී ඇති අතර ඉන් පසු මාර්ගය කොන්ක්‍රීට් කිරීම සිදුකර ඇත. මාර්ගය සංවර්ධනය කිරීමෙන් පසුව අනාවරණය වී ඇත්තේ ප්‍රතිපාදන වෙන් වූ මාර්ගය නොව ඒ අසල ඇති වෙනත් මාර්ගයක් සංවර්ධනය කර ඇති බවයි. එබැවින් අත්තිකාරම් මුදල පියවීමට මෙතෙක් නොහැකි වී ඇත. |

**3.4 ප්‍රසම්පාදනය**

**කොන්ත්‍රාත් පරිපාලනය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2017 දෙසැම්බර් 06 දින වැඩ අවසන් කර තිබුණු වැඩ වටිනාකම රු. 1,724,692 ක් වූ දකුණු දෙල්ලබඩ සිට උතුරු දෙල්ලබඩ දක්වා වූ සංවර්ධනය කරන ලද මාර්ගයේ බොහෝ ස්ථාන වල ගල් මතුවී ඇති නිසා එහි නිමාව සතුටුදායක මට්ටමක නොපවතින බවත්, කොන්ක්‍රීට් ස්ථරයේ ඝනකම නිසි ප්‍රමිතියෙන් තොර බවත්, කොන්ක්‍රීට් මිශ්‍රණය අධික වැලි සාන්ද්‍රනයකින් යුතු බවත් 2018 ඔක්තෝබර් 04 දින සභාවේ කාර්මික නිලධාරී සමඟ සිදු කරන ලද ස්ථානීය | කර්මාන්ත වල ප්‍රමිතිය පරීක්ෂා කළ යුතු අතර, සිදුව ඇති අඩුපාඩු රඳවුම් මුදල් ගෙවීමට පෙර නිවැරදි කරගත යුතුවේ. | මෙම ව්‍යාපෘතියේ රඳවුම් මුදල් ගෙවා නොමැති අතර, එම මුදල් ගෙවීමට පෙර මාර්ගයේ ගල් මතුවුණු ස්ථාන සම්පූර්ණයෙන් කඩා ඉවත් කර නැවත සකස් කිරීමට කටයුතු කරමි. |

පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. මෙම අඩුපාඩු රඳවුම් මුදල් යොදවා සකස් කර ගන්නා බව 2019 මැයි 10 දිනැති සභා ලේකම්ගේ ලිපියේ දක්වා තිබුණි.

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 4.1 අයවැය පාලනය

පහත සඳහන් කරුණු හේතුවෙන් වාර්ෂික අයවැය මූල්‍ය පාලන කාරකයක් ලෙස යොදා ගැනීමට සභාව අපොහොසත් වී තිබුණි.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් 11 කට අදාලව එකතුව රු. 6,780,951 ක් වූ මුළු ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි. | සැලසුම් සහගත ලෙස ප්‍රතිපාදන වෙන් කිරීමටත් එකී ප්‍රතිපාදන ඵලදායී ලෙස උපයෝජනය කිරීමටත් කටයුතු කළ යුතුවේ. | ඇස්තමේන්තු කල ඇතැම් කාර්යයන් වර්ෂය තුල ක්‍රියාත්මක නොවීම හේතුවෙන් ප්‍රතිපාදන ඉතිරි වී ඇත. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් 04 කට අදාලව එකතුව රු. 20,451,211 ක් වූ මුළු ප්‍රතිපාදනයෙන් සියයට 87 සිට සියයට 95 දක්වා පරාසයක ප්‍රතිශතයක් ඉතිරි වී තිබුණි. | සැලසුම් සහගත ලෙස ප්‍රතිපාදන වෙන් කිරීමටත් එකී ප්‍රතිපාදන ඵලදායී ලෙස උපයෝජනය කිරීමටත් කටයුතු කළ යුතුවේ. | ඇස්තමේන්තු කල ඇතැම් කාර්යයන් වර්ෂය තුල ක්‍රියාත්මක නොවීම හේතුවෙන් ප්‍රතිපාදන ඉතිරි වී ඇත. |

### 4.2 විගණන හා කළමනාකරණ කමිටු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවා ක්‍රියාත්මක කිරීම සඳහා පියවර ගෙන නොතිබුණි. | විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවා ක්‍රියාත්මක කල යුතුවේ. | පෙන්වා දී ඇති පරිදි නිවැරදි කිරීමට ඉදිරියේදී කටයුතු කරමි. |